# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1914/40 - 2015 මැයි මස 15 වැනි සිකුරාදා - 2015.05.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

නිවේදනයයි

මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 289 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද මහා නගර සභා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකයින් සඳහා වන දීමනාවලට අදාළ නියෝග මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග 2014.11.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි කරුණට අදාළව *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* අංක 1391/25 හා 2005 මැයි 06 දිනැති *ගැසට් පත්‍රයේ* සඳහන් නියෝග පරිච්ඡින්න කරනු ලැබේ.

සරත් ඒකනායක,
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
මධ්‍යම පළාත.

ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*නියෝග*

1. මෙම නියෝග මධ්‍යම පළාතේ මහා නගර සභා නගරාධිපතිවරුන්ට, නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට සහ සභිකයිනට දීමනා ගෙවීමේ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. මධ්‍යම පළාත් මහා නගර සභා සඳහා තේරීපත් වන මහා නගර සභා නගරාධිපතිවරුන්ට, නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට හා සභිකයිනට පහත සඳහන් පරිදි වූ දීමනාවක් 2014 නොවැම්බර් 01 වැනි දින සිට ගෙවිය හැකි වේ.

| | |
|---|---|
| නගරාධිපති | - රු. 30,000.00 |
| නියෝජ්‍ය නගරාධිපති | - රු. 25,000.00 |
| සභික | - රු. 20,000.00 |

3. (1) පහත සඳහන් අවස්ථාවන්හිදී මහා නගර සභා නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු, සභිකයෙකු


1A - PG 2463 — 106 (2015/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත දීමනා සඳහා හිමිකම් නොලබයි.

I. සභාවේ අවසරය නොලබා දීමනා ගෙවීමට අදාළ මාසයේ සභා රැස්වීම සහ කාරක සභා රැස්වීම්වලට සහභාගි නොවීම.

II. සභාවෙහි කාර්යයන්ට පරිබාහිර වූ පෞද්ගලික කාර්යයන් සඳහා විදේශගතව සිටීම.

III. කිසියම් සාපරාධී චෝදනාවන්ට අදාළව රැඳවුම්භාරයේ සිටීම හෝ සිරගත වී සිටීම.

(2) මෙම නියෝගයේ I ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු හෝ සභිකවරයෙකු රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමට හෝ කාරක සභා රැස්වීමකට සහභාගි නොවීම හේතුව මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතුය.

05 - 800/1

---

## මධ්‍යම පළාතේ පළාත් සභාව

### නිවේදනයයි

මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද නගර සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා වන දීමනාවලට අදාළ නීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2014.11.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි කරුණට අදාළව *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක* 1391/25 හා 2005 මැයි 06 දිනැති *ගැසට් පත්‍රයේ* සඳහන් රීති පරිච්ඡින්න කරනු ලැබේ.

සරත් ඒකනායක,
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
මධ්‍යම පළාත.

ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*රීති*

1. මෙම රීති මධ්‍යම පළාතේ නගර සභා සභාපති, උප සභාපති සහ සභිකයිනට දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

2. මධ්‍යම පළාත් නගර සභා සඳහා තේරීපත් වන නගර සභා සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා සභිකයිනට පහත සඳහන් පරිදි වූ දීමනාවක් 2014 නොවැම්බර් 01 වැනි දින සිට ගෙවිය හැකි වේ.

| | |
|---|---|
| සභාපති | - රු. 25,000.00 |
| උප සභාපති | - රු. 20,000.00 |
| සභික | - රු. 15,000.00 |

3. (1) පහත සඳහන් අවස්ථාවන්හිදී නගර සභා සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු, සභිකයෙකු යථෝක්ත දීමනා සඳහා හිමිකම් නොලබයි.

i. සභාවේ අවසරය නොලබා දීමනා ගෙවීමට අදාළ මාසයේ සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගි නොවීම.

ii. සභාවෙහි කාර්යයන්ට පරිබාහිර වූ පෞද්ගලික කාර්යයන් සඳහා විදේශගතව සිටීම.

iii. කිසියම් සාපරාධී චෝදනාවන්ට අදාළව රැඳවුම්භාරයේ සිටීම හෝ සිරගත වී සිටීම.

(2) මෙම රීතියේ I ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු හෝ සභිකවරයෙකු රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමට හෝ කාරක සභා රැස්වීමකට සහභාගි නොවීම හේතුව මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතුය.

05 - 800/2

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

**නිවේදනයයි**

මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා වන දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2014.11.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි කරුණට අදාළව *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක* 1391/25 හා 2005 මැයි 06 දිනැති *ගැසට් පත්‍රයේ* සඳහන් රීති පරිච්ඡින්න කරනු ලැබේ.

සරත් ඒකනායක,
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
මධ්‍යම පළාත.

ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

***රීති***

1. මෙම රීති මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති සහ සභිකයිනට දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

2. මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා සඳහා තේරීපත් වන සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා සභිකයිනට පහත සඳහන් පරිදි වූ දීමනාවක් 2014 නොවැම්බර් 01 වැනි දින සිට ගෙවිය හැකි වේ.

| | |
|---|---|
| සභාපති | - රු. 25,000.00 |
| උප සභාපති | - රු. 20,000.00 |
| සභික | - රු. 15,000.00 |

3. (1) පහත සඳහන් අවස්ථාවන්හිදී ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු සභිකයෙකු යථෝක්ත දීමනා සඳහා හිමිකම් නොලබයි.

I. සභාවේ අවසරය නොලබා දීමනා ගෙවීමට අදාළ මාසයේ සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගි නොවීම.

II. සභාවෙහි කාර්යයන්ට පරිබාහිර වූ පෞද්ගලික කාර්යයන් සඳහා විදේශගතව සිටීම.

III. කිසියම් සාපරාධී චෝදනාවන්ට අදාළව රැඳවුම්භාරයේ සිටීම හෝ සිරගත වී සිටීම.

(2) මෙම රීතියේ I ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු හෝ සභිකවරයෙකු රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමට හෝ කාරක සභා රැස්වීමකට සහභාගි නොවීම හේතුව මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතුය.

05 - 800/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.